මගේ අංකය: සීඑස් 01/01,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.
2018.10. 16

සබරගමුව පළාත් සභාවේ,
සියලුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සහ ආයතන ප්‍රධානීන් වෙත.

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීගේ වාර්ෂික ස්ථාන මාරු - 2019**

උක්ත කරුණට අදාලව මගේ සමාංක හා 2018.07.09 දිනැති ලිපියෙන් කැඳවන ලද ස්ථාන මාරු ඉල්ලීම් සලකා බැලීමෙන් පසු, ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ සලකා බලා 2019.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය /සංවර්ධන නිලධාරී සේවය /රියදුරු සේවය /කාර්යාල කාර්ය සහයක සේවය යන තනතුරුවල සේවය කරන නිලධාරීන්ට ලබාදී ඇති ස්ථාන මාරුවීම් නියෝග WWW.sg.gov.lk යන වෙබ් අඩවියට ඇතුලත් කර ඇත.

02. ස්ථාන මාරුවීම් නියෝග කර ඇති නිලධාරීන් 2019.01.01 දිනට නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීම සඳහා මුදා හැරීමට කටයුතු කරන්න. ස්ථාන මාරුකර ඇති නිලධාරීන් නියමිත දිනට සේවයෙන් නිදහස් නොකිරීමෙන් ඇතිවන ගැටලු සම්බන්ධයෙන් එම ආයතන ප්‍රධානීන් වගකීමට බැඳෙන බව වැඩිදුරටත් දන්වමි.

03. මෙම ස්ථාන මාරුවීම් ස්ථාන මාරු පරිපාටියට අනුව නිලධාරීන්ගේ ඉල්ලීම් සලකා බලා තීරණය කර ඇති අතර එම ස්ථාන මාරුවීම් නියෝග අනුව ස්ථාන මාරුකර ඇති නිලධාරීන් 2019.01.01 දිනට මුදා හැරීමටත්, ලබා දෙන අනුප්‍රාප්තිකයින්ට අදාළවිෂයයන් භාරදී අවශ්‍ය පුහුණුව හා උපදෙස් නොපමාව ලබාදීමටත් අවශ්‍ය කටයුතු කරනමෙන් කාරුණිකව දන්වන අතර, වාර්ෂික ස්ථාන මාරුවීම් ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගේ පූර්ණ සහයෝගයද අපේක්ෂා කරමි.

04. ස්ථාන මාරුවී යාමට ප්‍රථම ඔවුන්ගේ භාරයේ ඇති රජයට අයත් දේපල,ලියවිලි,මිලමුදල් හෝ වෙනයම් දෙයක් වේ නම් ඒවා ඔබ විසින් නම් කරනු ලබන නිලධාරියෙකුට විධිමත් පරිදි භාරදීමට කටයුතු සලසන්න.

05. 2019 වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කරන්නේ නම් ඒවා 2018.10.30 දිනට පෙර ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය ද සහිතව ඉදිරිපත් කළයුතු බව දැන්වීමට ද කටයුතු කරන්න.

හේරත් පී.කුලරත්න,
ප්‍රධාන ලේකම්,
සබරගමුව පළාත.

හේරත් පී. කුලරත්න
ප්‍රධාන ලේකම්
සබරගමුව පළාත
නව නගරය - රත්නපුර